# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2065/48 – 2018 අප්‍රේල් 06 වැනි සිකුරාදා – 2018.04.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: CI/175/2004.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමඟ කියවෙන පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2007.04.27 වන දින අංක 1494/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2007.04.17 වැනි දින දරන නියෝගයෙන්, –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක. 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලිමිටඞ්, තැ. පෙ. 06, කොලොන්නාව සහ
02. එන්. එච්. ඒ. සෝමපාල මහතා, අංක. 114/ඒ, පහළ බියන්විල, කඩවත.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

2007.03.22 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බී. මානවඩු මහතා වෙත යොමු කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2007.04.17 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2017 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ දී ය.

04 - 761/ 1

---

මගේ අංකය: CI/175/2004.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

## 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. වෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පීඑල්සී, (පැරණි නාමය - කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලංකා ලිමිටඩ්), තැ. පෙ. 06, කොලොන්නාව සහ
02. එන්. එච්. ඒ. සෝමපාල මහතා, අංක 114/ඒ, පහල බියන්විල, කඩවත.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මාතලේ, මෙල්පිටිය, නො. 75, හි එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2017 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: CI/175/2004.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ෂෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පී. එල්. සී. කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලිමිටඩ් ලංකා , තැ. පෙ. 06, කොළොන්නාව.
02. එන්. එච්. ඒ. සෝමපාල මහතා, අංක 114/ඒ, පහළ බියන්විල, කඩවත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ෂෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පීඑල්සී (පැරණි නාමය - කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලංකා ලිමිටඩ්) හි සේවය කළ ටී. මර්වින් පෙරේරා, කේ. ඒ. සමන්ත, එච්. ඩබ්ලිව්. ගුණපාල සහ ආර්. එම්. ඩබ්ලිව්. යූ. බණ්ඩාර යන සේවකයන් සිව් (04) දෙනා එන්. එච්. ඒ. සෝමපාල යන අයගේ සේවකයන් බව පවසමින් ඔහු මගින් ඔවුන්ගේ සේවය අවසන් කිරීම සාධාරණ හා යුක්ති සහගත වන්නේද? එසේ නොවන්නේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මාර්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 - 761/ 2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.